# දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - අධි පන්තිය සේවා ගණයේ පොෂ්ය දුම්රිය ස්ථානාධිපති තනතුරු සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය

01. සම්බන්ධවන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: ශ්‍රී ලංකා දුම්රිය    යොමු අංකය : ප.04/117/බ.ගැ.ප./දු.ස්ථා./අධි
දිනය 2013.12.27

1:2 අමාත්‍යාංශය: ප්‍රවාහන හා මහාමාර්ග    යොමු අංකය :එම්.ටී/03/එෆ්/නවදු.ස්ථා.බ.ගැ.ප
දිනය: 2013.12.30

1:3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

| | | | |
|---|---|---|---|
| යොමු අංකය: | DMS/F2/DR/01 | දිනය: | 2013.04.09 |
| | DMS/1142 | | 2014.04.30 |
| | DMS/1142 | | 2014.06.20 |

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය: යොමු අංකය: EST-2/RECRU/03/1270
දිනය: 2013.09.23

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය: NSCC/3/43/1/SR-2    දිනය: 2013.05.28

1.6 අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීම

තීරණයේ අංකය: අමප/09/2010/358/093    දිනය: 2010.01.01

1.7 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය: PSC/EST/04-01-43/01/2014 හා2014.11.25

සංශෝධිත    දිනය: 2020.11.06

02. පත්කිරීම් බලධරයා :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර:

3.1 සේවා ගණය :- අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - අධි පන්තිය

3.2 ශ්‍රේණි :- විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවත්නා දුම්රිය ස්ථානයන්හි කාර්යයන්ට අදාළව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිශ්චිතව පවරාදෙනු ලබන පිරිස් පාලනය, මූල්‍ය හා වාණිජ කටයුතු, සම්බන්ධීකරණ කාර්යයන්, මෙහෙයුම් කටයුතු, ප්‍රවේශපත්‍ර හා ගිණුම් සම්බන්ධ කටයුතු ඇතුළු බහු කාර්යය ස්වරූපයේ කාර්යයන් සහ අධීක්ෂණ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :-

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය :- MN-07

5.2 වැටුප් පරිමාණය :- රු. 41, 580 - 11 x 755 - 18 x 1030 – 68,425

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ ශ්‍රේණිය | පියවර 05 | රු. 44,600 /- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| දුම්රිය ස්ථාන අධිකාරි | 02 | I. කොළඹ කොටුව / මරදාන යන ප්‍රධාන දුම්රිය ස්ථාන දෙකෙන් එකක සියළුම රාජකාරි භාර නිලධාරියා වශයෙන් කටයුතු කිරීම.<br><br>II. දුම්රිය දෙපාර්තමේන්තුව හා සේවා දායකයින් අතර නිරන්තර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම.<br>III. දුම්රිය ස්ථාන සීමාව තුළ ඇති දුම්රිය දේපල වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ දුම්රිය ස්ථාන අලංකාරව මෙන් ම පිරිසිදුව පවත්වාගෙන යාම.<br><br>IV. දුම්රිය ස්ථාන කාර්ය මණ්ඩල කළමනාකරණය.<br><br>V. පරිපාලන, අධීක්ෂණ හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>VI. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, ගමනාගමන අධිකාරිගේ සහ බලය පැවරූ අනෙකුත් මෙහෙයුම් නිලධාරීන්ගේ සෘජු නියෝග හා උපදෙස් ක්‍රියාත්මක කිරීම. |

| | | |
|---|---|---|
| බඩු ගබඩා පාලක | 01 | I. බඩු ගබඩා කාර්යාලයේ සියළුම රාජකාරි භාර නිලධාරියා වශයෙන් කටයුතු කිරීම.<br><br>II. දුම්රිය දෙපාර්තමේන්තුව හා සේවා දායකයින් අතර නිරන්තර සම්බන්ධීකරණ කටයුතු කරමින් හා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීම හා වැඩි දියුණු කිරීම.<br><br>III. දුම්රිය බඩු ගබඩා සීමා තුළ ඇති දුම්රිය දේපලවල සුරක්ෂිතතාවය තහවුරු කිරීම.<br><br>IV. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, ගමනාගමන අධිකාරිගේ සහ බලය පැවරූ අනෙකුත් මෙහෙයුම් නිලධාරීන්ගේ සෘජු නියෝග හා උපදෙස් ක්‍රියාත්මක කිරීම. |
| ප්‍රධාන දුම්රිය පාලක | 01 | I. මරදාන ප්‍රධාන දුම්රිය පාලක කාර්යාලයේ සියළුම රාජකාරි භාර නිලධාරියා වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම.<br><br>II. දුම්රිය පාලක කාර්ය මණ්ඩලය පරිපාලනය කිරීම.<br><br>III. ධාවනයෙහි යොදවා ඇති සියළුම දුම්රියන්හි වෙනස්කම් කිරීමේ හෝ අවලංගු කිරීමේ වගකීම ( දුම්රිය ගැටීම, දුම්රිය පීලි පැනීම, නායයෑම් වැනි වෙනත් ස්වභාවික විපතක් වූ අවස්ථාවක ස්ථානෝචිත පරිදි මගී ජීවිත හා දුම්රිය දේපල ආරක්ෂා වන පරිදි දුම්රිය ධාවන කටයුතු මෙහෙයවීම)<br><br>IV. දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති වෙනත් නිලධාරීන් හෝ සේවකයන්ගේ පරිපාලන අධීක්ෂණ කටයුතු සිදු කිරීම.<br><br>V. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, ගමනාගමන අධිකාරිගේ සහ බලය පැවරූ අනෙකුත් මෙහෙයුම් නිලධාරීන්ගේ සෘජු නියෝග හා උපදෙස් ක්‍රියාත්මක කිරීම. |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (දුම්රිය ස්ථාන කාර්ය භාර) | 50 | I. දුම්රිය ස්ථානයේ සියළුම රාජකාරි භාර නිලධාරියා වශයෙන් කටයුතු කිරීම.<br><br>II. දුම්රිය දෙපාර්තමේන්තුව හා සේවා දායකයින් අතර නිරන්තර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම.<br><br>III. දුම්රිය ස්ථාන සීමාව තුළ ඇති දුම්රිය දේපල වල ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ දුම්රිය ස්ථාන අලංකාරව මෙන් ම පිරිසිදුව පවත්වාගෙන යාම<br><br>IV. ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම, ඇණවුම් කිරීම, පාර්සල් සහ බඩු ප්‍රවාහනයට අදාළ සියළු කටයුතු අධීක්ෂණය කිරීම.<br><br>V. දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතියේ දෝෂ වාර්තා වූ විට අදාළ අංශවලට වාර්ථා කර ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම.<br><br>VI. දුම්රිය ස්ථාන කාර්ය මණ්ඩලය කළමනාකරණය.<br><br>VII. දුම්රිය ස්ථාන ගිණුම් කටයුතු සිදු කිරීම හා ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී වෙත මුදල් ප්‍රේෂණය කිරීම. |

| | | |
|---|---|---|
| | | VIII. දුම්රිය ස්ථානයට දුම්රියයන් ඇතුළු කර ගැනීම, පිටත්කරවීම හා සියළුම මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.<br><br>IX. සේවා අවශ්‍යතාවය පරිදි දුම්රිය නියාමකවරුන්ගේ සේවා වාර සැකසුම, සේවයේ යෙදවීම සහ කාර්යාලයීය පරිපාලන කටයුතු සිදු කිරීම.<br><br>X.පරිපාලන, අධීක්ෂණ හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම<br><br>XI. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, ගමනාගමන අධිකාරිගේ සහ බලය පැවරූ අනෙකුත් මෙහෙයුම් නිලධාරින්ගේ සෘජු නියෝග හා උපදෙස් ක්‍රියාත්මක කිරීම. |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්ය භාර) | 10 | I. දුම්රිය ධාවනයේදී ඇතිවන පීලි පැනීම, මාර්ග අවහිරතා, එන්ජින් ක්‍රියා විරහිත වන අවස්ථාවන්හිදී දුම්රිය ස්ථානාධිපතිවරුන්, අදාළ ෆෝමන්වරු, ස්ථිර මාර්ග පරීක්ෂකවරු, දුම්රිය රියදුරන් හා නියාමකවරුන් දැනුවත්කර අවහිරතාවයකින් තොරව දුම්රිය ධාවනයට කටයුතු යෙදීම.<br><br>II. පීලි පැනීම, දුම්රිය අනතුරු, ස්වාභාවික අනතුරු, හා එවැනි අවස්ථා වලදී දුම්රිය ධාවනය අඛණ්ඩව සහ නිසි පරිදි පවත්වාගෙන යැමට මෙහෙයුම් කාර්යයන් ඉටු කිරීම.<br><br>III. බඩු දුම්රියන් ධාවනයේදී අවශ්‍ය මැදිරි හා ගැල් ඈමිණීම හා ගැලවීම පිළිබඳව නියාමකවරුන් හා දුම්රිය ස්ථානාධිපතිවරුන්, අංගනාධිපතිවරුන් ට අදාළ පරිදි මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව දැනුවත් කිරීම.<br><br>IV.දුම්රිය ස්ථාන දෙකක් අතර හා වර්ණ සංඥා අංශයේ නියමු ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය මෙහෙයුම් උපදෙස් හා දැනුවත් කිරීම් සිදු කිරීම<br><br>V. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, ගමනාගමන අධිකාරිගේ සහ බලය පැවරූ අනෙකුත් මෙහෙයුම් නිලධාරින්ගේ සෘජු නියෝග හා උපදෙස් ක්‍රියාත්මක කිරීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :-

| | |
|---|---|
| දුම්රිය ස්ථාන අධිකාරි | 02 |
| බඩු ගබඩා පාලක | 01 |
| ප්‍රධාන දුම්රිය පාලක | 01 |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (දුම්රිය ස්ථාන කාර්යභාර) | 50 |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) | 10 |

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරට බඳවා ගැනීමට අදාළව

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 35% |
| කුසලතා | 65% |

7.2 විවෘත බඳවා ගැනීම :- අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම :-

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :-

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :-

| තනතුර | පළපුරුද්ද |
|---|---|
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (දුම්රිය ස්ථාන කාර්යභාර) | දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියේ අවුරුදු පහකට (05) නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම. |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති ( පාලක මැදිරි කාර්යභාර) | දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියේ තනතුරක අවුරුදු පහකට (05) නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.<br><br>දුම්රිය පාලක කාර්යාලයක අවුරුදු පහකට (05) නොඅඩු සේවා කාලයක් තිබීම. |

සංලක්ෂය :- 1. ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරු අතර ඇති කොළඹ දුම්රිය පාලක කාර්යාලයේ ප්‍රධානියා සහ වර්ණ සංඥා අධීක්ෂක රාජකාරි ඉටු කරන ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) තනතුරු පහ (05) ට තෝරාගනු ලබන්නේ වර්ෂ තුනක වර්ණ සංඥා දුම්රිය පාලක කටයුතු සමග අඩු වශයෙන් වර්ෂ අටක දුම්රිය පාලක කටයුතු පිළිබඳ අඛණ්ඩ පළපුරුද්දක් සමග නියමිත සුදුසුකම් ඇති අය පමණි.

2 නාවලපිටිය, අනුරාධපුර දුම්රිය පාලක කාර්යාලවල ප්‍රධානීන් කාලසටහන් ශාඛාවේ ප්‍රධානියා, හා ප්‍රධාන වැගන් පාලක රාජකාරි ඉටු කරන ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) තනතුරු 04 සඳහා පත් කරනු ලබන්නේ අඩු වශයෙන් වර්ෂ අටක දුම්රිය පාලක කටයුතු පිළිබඳ අඛණ්ඩ පළපුරුද්දක් සමග නියමිත සුදුසුකම් ඇති අය පමණි.

7.3.2.4 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.3.2.5 වෙනත්

(I). අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(II). රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.

(III). 1 ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබිය යුතු ය.

(IV). තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 හි සඳහන් සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

7.3.3 වයස :- අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන සීමිත තරග විභාගයක ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරුකර ගැනීමෙන් අනතුරුව සීමිත තරග විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය :- (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 50% |
| වාණිජ රෙගුලාසි හා දුම්රිය ආරක්ෂක නීති | 100 | 50% |
| භාෂා හැකියාව | 100 | 50% |

7.3.4.1.1 පවත්වන බලධරයා :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:-

බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

සටහන: සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේ දී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:- අදාළ නැත

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :-

රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- , විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :-

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නැත

7.4.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත

7.4.2.3 පළපුරුද්ද :-

| තනතුර | පළපුරුද්ද |
|---|---|
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (දුම්රිය ස්ථාන කාර්යභාර) | 1. දුම්රිය ස්ථානාධිපති (මෙහෙයුම්) වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් හෝ දුම්රිය ස්ථානයක ස්ථාන භාර නිළධාරියකු වශයෙන් දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියේ අවුරුදු එක (01) ක සේවා කාලයක් තිබීම.<br>2. දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියේ වසර හත(07) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) | දුම්රිය පාලක කාර්යාලයක දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියට නියමිත තනතුරක වසර 07 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

සැලකිය:

1. ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරු අතර ඇති කොළඹ දුම්රිය පාලක කාර්යාලයේ ප්‍රධානියා සහ වර්ණ සංඥා අධීක්ෂක රාජකාරි ඉටු කරන ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) තනතුරු පහ (05) ට තෝරාගනු ලබන්නේ වර්ෂ තුනක වර්ණ සංඥා දුම්රිය පාලක කටයුතු සමග අඩු වශයෙන් වර්ෂ අටක දුම්රිය පාලක කටයුතු පිළිබඳ අඛණ්ඩ පළපුරුද්දක් සමග නියමිත සුදුසුකම් ඇති අය පමණි.

2. නාවලපිටිය, අනුරාධපුර දුම්රිය පාලක කාර්යාලවල ප්‍රධානීන් කාලසටහන් ශාඛාවේ ප්‍රධානියා, හා ප්‍රධාන වැගන් පාලක රාජකාරි ඉටු කරන ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති (පාලක මැදිරි කාර්යභාර) තනතුරු 04 සඳහා පත් කරනු ලබන්නේ අඩු වශයෙන් වර්ෂ අටක දුම්රිය පාලක කටයුතු පිළිබඳ අඛණ්ඩ පළපුරුද්දක් සමග නියමිත සුදුසුකම් ඇති අය පමණි.

7:4:2:4. කායික සුදුසුකම් :-

I සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් :-

I අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

II රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබිය යුතු ය.

IV තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2 හි සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

7.4.3. බඳවා ගැනීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.4.3.1. ලිඛිත විභාගය :- අදාළ නැත.

7.4.3.2. වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.4.3.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුර සඳහා

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද | 80 | අදාළ නොවේ. |
| කුසලතාවය | 20 | |
| එකතුව | 100 | |

සටහන

බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කර ගත යුතු ය.

7.4.3.3.1. ව්‍යුහගත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත

7.4.4 අයැදුම්පත් කැඳවීමේ ක්‍රමය

රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් :- අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාවය :- අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම :- අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම :-

දුම්රිය ස්ථාන අධිකාරි, බඩු ගබඩා පාලක, ප්‍රධාන දුම්රිය පාලක තනතුරු වලට පත් කිරීම

| තනතුර | සුදුසුකම් |
|---|---|
| දුම්රිය ස්ථාන අධිකාරි (කොළඹ කොටුව /මරදාන) | ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරක වසර 03 ක අඛණ්ඩ පළපුරුද්දක් ඇති නිලධාරියෙකු වීම.<br><br>සටහන<br>ඉහත සුදුසුකම් සහිත අයැදුම්කරුවන් නොමැති අවස්ථාවකදී ජ්‍යෙෂ්ඨතම දුම්රිය ස්ථානාධිපතිවරුන් අතුරින් සේවා පළපුරුද්ද හා කුසලතාව සැලකිල්ලට ගනිමින් දුම්රිය ස්ථාන අධිකාරි (කොළඹ කොටුව / මරදාන ) සහ බඩු ගබඩා පාලක තනතුරු වලට පත් කරනු ලැබේ. |
| බඩු ගබඩා පාලක | |

| | |
|---|---|
| ප්‍රධාන දුම්රිය පාලක | දුම්රිය පාලක කාර්යාලයේ වර්ෂ තුනක (03) වර්ණ සංඥා දුම්රිය පාලක කටයුතු සමග දුම්රිය පාලක කාර්යාලයක පවතින ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරක වසර තුනක (03) අඛණ්ඩ පළපුරුද්දක් ඇති නිලධාරියෙකු වීම.<br><br>සටහන<br><br>ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදි වර්ණ සංඥා දුම්රිය පාලක කටයුතු සමග දුම්රිය පාලක කාර්යාලයක පවතින ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරක සේවය කරන ජ්‍යෙෂ්ඨතම දුම්රිය ස්ථානාධිපතිවරුන් අතරින් සේවා පළපුරුද්ද හා කුසලතාව සැලකිල්ලට ගනිමින් ප්‍රධාන දුම්රිය පාලක තනතුරට පත් කරනු ලැබේ. |

11.2 පත් කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඉහත සුදුසුකම් සහිත ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාව සැලකිල්ලට ගනිමින් එම මණ්ඩලයේ නිර්දේශ මත සහ පවතින පුරප්පාඩු අනුව දුම්රිය ස්ථාන අධිකාරි (කොළඹ කොටුව/ මරදාන) බඩු ගබඩා පාලක, ප්‍රධාන දුම්රිය පාලක තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි: අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන:

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:-

මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. 2010.01.01 දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN-07-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන දුම්රිය ස්ථානාධිපති අධි ශ්‍රේණියේ තනතුර දරණ නිලධාරියා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙන ය. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලග ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතු ය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ: අත්සන ..........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම: ඒ. ජේ. පී. අයිශානි
තනතුර: පරිපාලන නිලධාරි (පන්තිය II)
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.
දිනය: 2022 07 27

පරීක්ෂා කළේ: අත්සන ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම: එච්. එම්. එස්. පී. [illegible]
තනතුර: අතිරේක සාමාන්‍ය [illegible]
දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.
දිනය: 2022 . 08 . 01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
තනතුර: දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.
දිනය: 2022 . 08 . 18

නිලමුද්‍රාව

යොමු අංකය: එම්ටී/03/එෆ්/නව දූ.ස්ථා බ.ගැ.ප.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - අධි පන්තිය සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: ..........................

නම: ආර්. ඩබ්. ආර්. පේමසිරි
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
07 වන මහල,
සෙත්සිරිපාය, අදියර II,
බත්තරමුල්ල

ලේකම්,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

දිනය: 2022 . 09 . 09 නිලමුද්‍රාව

යොමු අංකය: PSC/EST/04-01-43/01/2014

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - අධි පන්තිය සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීම් පටිපාටිය 2014.11.25 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

අත්සන: ..............................

නම: එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2022.12.19 නිලමුද්‍රාව

01. විභාගයේ නම :- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර අයි පන්තිය සේවා ගණයේ ජොෂ්ඨ දුම්රිය ස්ථානාධිපති තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 50 % |
| වාණිජ රෙගුලාසි හා දුම්රිය ආරක්ෂක නීති | පැය 03 | 100 | 50% |
| භාෂා හැකියාව | පැය 03 | 100 | 50 % |

03 විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය | තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 02. වාණිජ රෙගුලාසි හා දුම්රිය ආරක්ෂක නීති | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.එක් එක් කොටසකට සමාන ලකුණු හිමි වේ.<br>(I වන කොටස - වාණිජ රෙගුලාසි)<br>දුම්රිය වාණිජ රෙගුලාසි වලට අදාලව ගිණුම්කරණය, අලෙවිකරණය හා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම, පාර්සල් හා බඩු ප්‍රවාහනය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.<br>(II වන කොටස දුම්රිය ආරක්ෂක නීති)<br>දුම්රිය ගමනාගමනයට අදාළ වන සංඥා, මෙහෙයුම් නීති රෙගුලාසි හා දුම්රිය මෙහෙයුම් කටයුතුවලදී අනුගමනය කළ යුතු ආරක්ෂක නීති සම්බන්ධ රෙගුලාසි පිළිබඳ දැනුම. |
| 03. භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.<br>(I වන කොටස)<br>මෙම කොටස රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.<br>(II වන කොටස)<br>භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුනු පාඨයන් කිහිපයකින් දෙවැනි කොටස සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගෙන් අර්ථය තනි වාක්‍යකින් ප්‍රකාශ කරන ලෙස හෝ විකල්ප ඛාණ්ඩයකින් ඉතාමත් උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු තෝරා දක්වන ලෙස හෝ අපේක්ෂකයන් වෙත නියම කරනු ලැබේ. |

04 පවත්වනු ලබන බලධාරියා :- විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

05 පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :- පූරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

සකස් කළේ: අත්සන ..............................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම: ඒ. ජේ. සී. අයිශානි
පරිපාලන නිලධාරි (පත්වීම් 1)
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

තනතුර: ..............................

දිනය: 2022.07.27

පරීක්ෂා කළේ: අත්සන ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම: එච්. එම්. එස්. පී. හිරේරා
[illegible]
දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

තනතුර: ..............................

දිනය: 2022.08.01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

තනතුර: කොළඹ 10.

දිනය: 2022.08.18

නිලමුද්‍රාව